# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,820 — 1961 දෙසැම්බර් 9 වැනි සෙනසුරාදා — 9.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### නිවේදනය

1946 හා 1947 ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජසභා නියෝගවල 46 (4) අංකිත ඡේදයේ විධිවිධාන යටතේ අලෙවි බද්ද, වෘත්තීන් හා වෙළඳ ව්‍යාපාර ලියාපදිංචි කිරීම හා ජාතික සංවර්ධන බද්ද යන විෂයයන් මේ නිවේදනයේ සඳහන් දින සිට මුදල් ඇමතිවරයාට මවිසින් පවරා ඇති බවත්, ඒ අනුව ඉහත සඳහන් ඡේදය යටතේ කරනු ලැබ, 1960 ජූලි 23 වැනි දින හා අංක 12,165 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළකර පසුව කලින් කල සංශෝධනය කරන ලද නිවේදනයේ "Minister of Finance" යන ශීර්ෂය යටතේ දෙවැනි තීරයේ වූ "Inland Revenue" යන උප ශීර්ෂය යටතේ යොදා ඇති කරුණු වලට පසුව පහත දැක්වෙන අළුත් කරුණු එකතු කිරීමෙන් එකී නිවේදනය තවදුරටත් සංශෝධනය කරන බවත්, මෙයින් දනුම් දෙනු ලැබේ :—

"Sales Tax".
"Registration of Professions and Businesses".
"National Development Tax".

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැතිණිය.

අග්‍රාමාත්‍ය කාර්‍යාලය,
කොළඹ.
1961 දෙසැම්බර් 5.
12-788

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රේගු නිවේදනය අංක 61/9/3

ආදායම් සංරක්ෂණ ආඥාපනත (250 වැනි අධිකාරය) යටතේ, අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාව අනුව, 1961 දෙසැම්බර් 11 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තුව පහත දැක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන් කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

| රබර් | රු. ශ. |
| --- | --- |
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම රාත්තලට ... | 1.19 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව රාත්තලට ... | .14 |

මැ. ලු. ඩී. කැෂ්පර්ස්,
ප්‍රධාන රේගු අයකැමි.

අංක : ඒ/781.
රේගු දෙපාර්තමේන්තුව,
කොළඹ, 1961 දෙසැම්බර් 9.

12-801

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

2299——ජේ. ඇන්. ආර් 367–5,300 (12/61)